**ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය - 2022**

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඨමාලා ආදායම්, පාඨමාලා වියදම්, වෘත්තීය ගාස්තු සහ ගිණුම් වියදම් යන ආදායම් හා වියදම් විෂයයන් සඳහා ලෙජරයේ ගිණුම් පවත්වා නොතිබුණි. | වෘත්තීය ගාස්තු සහ ගිණුම්කරණ ගාස්තු සඳහා 2023 වසරේදී ගිණුම් ලෙජරය වෙත එක් කෙරේ. | සියළුම රේඛීය අයිතමයන් සඳහාම ලෙජරයේ වෙන වෙනම ගිණුම් පවත්වා ගත යුතුය. |

### 1.5.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 17 හි 17.18 හා 17.20 ප්‍රකාරව වත්කම පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පැමිණි පසු දේපළ පිරියත හා උපකරණ එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමාණුකූල පදනමකට ක්ෂය වශයෙන් ලියා හැරිය යුතු නමුත් පෙර වර්ෂය අවසානය දක්වාම ආයතනයේ වත්කම් ක්ෂය කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණු අතර එහිදි පෙර වර්ෂයන් හි මිලදී ගත් වත්කම් භාවිතයට සූදානම් දිනය නොසළකා මිලදීගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂයට ක්ෂය | 2023 වර්ෂය තුළදී මිලදී ගන්නා ලද සියළුම වත්කම් එය අත්පත් කරගත් දිනය මත පදනම්ව ක්ෂය වන බවත් 2019 න් ඔබ්බට කරනු ලැබූ මිලදී ගැනීම් පිළිබඳව දින වකවානු ලේඛනගත වී නොමැති බැවින් ක්ෂයවීම් වෙනස් කම් සිදුකළ නොහැකි බවත් දන්වනු කැමැත්තෙමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

ප්‍රතිපාදනය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත ක්ෂය හා සමුච්චිත අරමුදල වැඩියෙන් නිරූපණය වන බවට නිරීක්ෂණය විය.

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) දේපළ පිරියත හා උපකරණ පිරිවැය | 541,363 | ස්ථාවර වත්කම් ලේඛනය හා වත්කම් සමීක්ෂණ වාර්තාව | ස්ථාවර වත්කම් ලේඛනය 2022 වසරේ සිට පවත්වාගෙන යනු ලබන අතර 2022 ට පෙර වත්කම් මිලදී ගැනීම්, මිලදීගත් දිනය වෙනුවට වසර සඳහන් කර ඇත. | වටිනාකම් තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලික ලියවිලි, පොත් පත් හා වාර්තා නිසි පරිදි පවත්වා ගත යුතුය. |
| (ආ) අනුග්‍රහකත්ව දීමනා | 525,000 | ලදු පත් | 2022 වර්ෂය තුළ සියලුම ලැබීම් සඳහා නිල ලදුපතක් නිකුත් කිරීම සිදු නොවුන අතර 2023 වර්ෂයේදී සියලුම සාමාජික ආදායම් සහ අනුග්‍රාහකත්ව ප්‍රධානයන් සඳහා මාර්ගගත රිසිට්පත් නිකුත් කර ඇත. | |
| (ඇ) සාමාජික ගාස්තු | 801,675 | සාමාජික නාමලේඛන, අදාළ ලදුපත් | | |
| (ඈ) පාඨමාලා ගාස්තු | 600,500 | පාඨමාලා ලිපිගොනු, ගාස්තු ලේඛනය | පිළිතුරු සපයා නොමැත. | |
| (ඉ) ගෙවීම් (චෙක්පත් මඟින්) | 7,620 | උපයෝගී ලේඛන සමඟ ගෙවීම් වවුචර් | පිළිතුරු සපයා නොමැත. | |
| (ඊ) ගෙවීම් (චෙක්පත් මඟින්) | 262,123 | බිල්පත්, මිල කැඳවීම්, තහවුරු ලේඛන ආදි උපයෝගි ලේඛන | පිළිතුරු සපයා නොමැත. | |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 (1) වගන්තිය | විගණනය කරනු ලබන සෑම අස්ථිත්වයක් සඳහාම අවස්ථාවෝචිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද මෙම ආයතනය විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2024 වර්ෂයේදී කටයුතු කෙරේ. | විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු ( විශේෂ විධිවිධාන) පනතේ 05 වැනි වගන්තිය සහ 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | වටිනාකම රු.25,000 කට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවත් සියළුම ගෙවීම්වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වටිනාකම රු.25,000 කට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් සියළුම ගෙවීම් වලදී අයකර ගැනීමට 2023 වසරේ සිට කටයුතු කරමි. | අදාළ පරිදි මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.352,822 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,868,944 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,516,122 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම හා අනෙකුත් මෙහෙයුම් ආදායම් රු.1,108,826 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.15,000 ක් වන ආයතනයේ සුළු මුදල් අග්‍රිමයෙන් කළ යුතු ගෙවීම්වල උපරිම සීමාවක් නියම කර නොතිබීම නිසා රු.1,000 සිට රු.10,400 ක් දක්වා පරාසයක වටිනාකමින් යුතු ගෙවීම් 2022 වර්ෂය තුළදී සිදුකර ඇති බවට නිරීක්ෂණය විය . | වටිනාකම රු.15,000 ක් වන ආයතනයේ සුළු මුදල් අග්‍රිමයෙන් කළ යුතු ගෙවීම්වල උපරිම සීමාවක් නියම කිරීමට කටයුතු කරමි. | සුළු මුදල් ගෙවීම් සඳහා සුදුසු සීමාවන් පවත්වා ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| PE/COP/POLI/Circular හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මගින් හඳුන්වාදුන් දී ඇති මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය අනුව ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ආයතනයේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 11 ක ප්‍රමාදයකින් පසුව 2024පෙබරවාරි 12 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | මෙම ප්‍රමාදය පිළිබඳව ආයතනයේ අවධානය යොමුකරන අතර 2023 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නියමිත දිනයට පෙර මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| PE/COP/POLI/Circular හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මගින් හඳුන්වාදුන් දී ඇති මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය අනුව මූල්‍ය වර්ෂය අවසාන වී මාස 05ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2021වර්ෂයේ සහ ඊට පෙර වර්ෂයන්හි වාර්ෂික වාර්තාවන් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | මේ පිළිබඳව ආයතනයේ අවධානය යොමුකර අදාළ පියවර ගැනීමට කටයුතු කරමි. | වාර්ෂික වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |